මොබිටෙල් ඩේටා ලෝන් යනු කුමක්ද?

මොබිටෙල් ඩේටා ලෝන් යනු පාරිභෝගිකයන්ට ලබා ගත හැකි ඩේටා බණ්ඩල වලට අනුව ඔවුන්ට ලබා ගත හැකි සුවිශේෂ දීමනාවකි.

ඔබට ලබා ගත හැකි ඩේටා ලෝන් බණ්ඩල මොනවාද?

| ගාස්තුව | වලංගු කාල සීමාව (දින) | නව බණ්ඩල | | |
|---|---|---|---|---|
| | | ඕනෑම වෙලාවක MB | රාත්‍රි කාලයේ MB | 4G බෝනස් බණ්ඩලය MB |
| 29.00 සැකසුම් ගාස්තු නොමැතිව | 3 | 150 | 150 | - |
| 29.00 සැකසුම් ගාස්තු නොමැතිව | 7 | 300 | 300 | 225 |
| 29.00 සැකසුම් ගාස්තු නොමැතිව | 21 | 600 | 600 | 450 |

මෙම ඩේටා ලෝන් එක ලබා ගත හැක්කේ කාටද?

ඔබ අප ජාලයේ රැඳී සිටි කාල සීමාව අනුව ඔබට ලබා ගත හැකි ඩේටා ලෝන් එකේ සීමාව තීරණය වනු ඇත.

| ඩේටා ලෝන් | අගය | වලංගු කාලය | කාලය | සැකසුම් ගාස්තු |
|---|---|---|---|---|
| 300 MB | රු. 29 | දින 3 | මාස 3ට වැඩි | රු. 2 + බදු |
| 825 MB | රු. 49 | දින 7 | මාස 6ට වැඩි | රු. 2 + බදු |
| 1650 MB | රු. 99 | දින 21 | අවු 1 1/2 ට වැඩි | රු. 5 + බදු |

මොබිටෙල් ඩේටා ලෝන්

මොබිටෙල් ඩේටා ලෝන් සමගින් අඛණ්ඩ බාධා රහිත අන්තර්ජාල සැරිසැරීමේ පහසුකම් (සර්ෆින්) කරුණාකර ඔබට අවශ්‍ය විට ඩේටා ලෝන් සක්‍රිය කර ගැනීමට පහත සඳහන් පියවර අනුගමනය කරන්න.

පෙර ගෙවුම් සබඳතා සඳහා මෙම සේවාව සක්‍රිය කර ගැනීම සඳහා ඔබේ මොබිටෙල් ජංගම දුරකථනයෙන් #170# අමතන්න.

පියවර 1 -
පියවර 2 - ඩේටා ලෝන් සඳහා 8 තෝරන්න
පියවර 3 - අදාළ ලෝන් එක තෝරන්න ( විකල්ප 1, 2 හෝ 3)

ඩේටා ලෝන් එකක් ලබා ගැනීම සඳහා සැමවිටම ඔබේ ගිණුම් ශේෂය රු. 5/- වඩා අඩු විය යුතුයි.

ඩේටා ලෝන් නැවත අය කර ගැනීම

ඊළඟ ටොප් අප්/රීලෝඩ් කිරීම කිරීමේදී ටොප් අප් කරන අගය අනුව සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් හෝ ඩේටා ලෝන් අය කර ගැනේ.

| අවස්ථාව | ස්වභාවය | උදාහරණය |
|---|---|---|
| ටොප් අප්/රීලෝඩ් අගය ඩේටා ලෝන් එක සහ රු. 2/-ක් වන සැකසුම් ගාස්තුවේ එකතුවට වඩා වැඩියි. | සම්පූර්ණ වශයෙන් ඩේටා ලෝන් එක නැවත ලබා ගැනීම සිදු වේ.<br>ටොප් අප් අගය ඩේටා ලෝන් අගයට වඩා වැඩි නම් ලෝන් එක සහ සැකසුම් ගාස්තුව නැවත අය කර ගැනීම ක්ෂණිකව සිදු වේ. | අය කර ගැනීමට ඇති ඩේටා ලෝන් එක + සැකසුම් ගාස්තුව (රු. 49 + රු. 2/- = රු. 51/-)<br>ගිණුම රු. 100/- කින් ටොප්/රීලෝඩ් කර ඇති විට සම්පූර්ණ රු. 51/- ක මුදල ඔබේ ගිණුමෙන් නැවත අය කර ගැනේ. |
| ටොප් අප්/රීලෝඩ් අගය ඩේටා ලෝන් එක සහ රු. 2/- වන සැකසුම් ගාස්තුවේ එකතුවට වඩා අඩුයි. | ටොප් අප් අගය ඩේටා ලෝන් අගයට වඩා අඩු නම් සැකසුම් ගාස්තුව (රු. 2/- ) ඇතුළත් වන පරිදි ඩේටා ලෝන් එක අර්ධ වශයෙන් අය කර ගැනීම සිදු වේ. | අය කර ගැනීමට ඇති ඩේටා ලෝන් එක + සැකසුම් ගාස්තුව (රු. 49 + රු. 2/- = රු. 51/-)<br>ගිණුම රු. 30/- කින් ටොප්/රීලෝඩ් කර ඇති විට හදිසි අවශ්‍යතා සඳහා රු. 10 ක් ඔබේ ගිණුමේ ඉතිරි වන පරිදි රු. 20/- ක් අර්ධ වශයෙන් අය කර ගැනීම සිදු වේ.<br>ඉතිරි රු.31/- ක ඩේටා ලෝන් එක සහ සැකසුම් ගාස්තුව (රු.29/- + රු. 2/- ) ඊළඟ ටොප් අප් /රීලෝඩ් අගයෙන් අය කර ගැනේ.<br><br>නැවතත් රු. 30/- ක් ටොප් අප්/රීලෝඩ් කළ විට නැවතත් හදිසි අවශ්‍යතා සඳහා රු. 10/- ක් ගිණුමේ ඉතිරි වන පරිදි රු. 20/- ක් ඩේටා ලෝන් එකෙන් අර්ධ වශයෙන් අය කර ගැනේ.<br>ඉතිරි රු. 11/ - අය කර ගැනෙන තෙක් මෙම ක්‍රියාවලිය නැවත සිදු වේ. |

අමතර තොරතුරු

- මෙය නැවත නැවත ලබා ගන්නා ලෝන් එකක් නොවන නිසා මෙම සේවාව ලබා ගැනීම සඳහා ඔබ විසින් ලියාපදිංචි වීම අවශ්‍ය නොවේ.
- මෙම සේවාව ලබා ගැනීම සඳහා අවම වශයෙන් ජාලය තුළ මාස 3 ක් රැඳී සිටිය යුතුයි.
- මෙම සේවාව ලබා ගත හැක්කේ පෙරගෙවුම් පාරිභෝගිකයින්ට පමණයි.
- ඔබට අදාළ ඩේටා ලෝන් අගය තෝරාගැනීමට හැකියි. (200MB, 825MB හෝ 1650MB)
- ඔබට ඩේටා ලෝන් එකක් ලබා ගත හැකි වන්නේ අනෙකුත් ලෝන් සියල්ල ගෙවා අවසන් කළ පසු පමණයි.
- වෙනත් ලෝන් එකක් ලබා ගෙන ඇත්නම් මෙම ඩේටා ලෝන් එක ඔබට ලබා ගත නොහැකියි.
- එක්වර ඩේටා ලෝන් 2 ක් ලබා ගත නොහැකියි.
- ඩේටා ලෝන් එක නැවත අය කර ගත් මොහොතේම ඒ පිළිබඳව SMS එකක් මගින් ඔබට දැනුම් දෙනු ලැබේ. (සම්පූර්ණ සහ අර්ධ වශයෙන් අය කර ගැනීම)
- ලෝන් නැවත ගෙවීම හෝ ගෙවීමට ඇති ලෝන් පිළිබඳ දැන ගැනීම සඳහා අපගේ ක්ෂණික ඇමතුම් අංකය 1717 අමතන්න.
- මොබයිල්/මොබයිල් බ්‍රෝඩ් බෑන්ඩ් සඳහා වන වෙනත් කොන්දේසි සහ නියමයන් අදාළ වේ.